# නිව්ටන් හා සංකාරා

විවිධ ක්ෂේත්‍රවල දැනුමේ පොදු බවක් ඇති බව සාකච්ඡාකිරීමෙන් පසුව අපට නැවතත් සදාචාරය, විශේෂයෙන් ම කලාවේ සදාචාරය ගැන අවධානය යොමුකළ හැකි ය. සදාචාරය කුමක් දැයි තීරණය කෙරෙන්නේ යම් සංස්කෘතියකට, චින්තනයකට සාපේක්ෂව ය. එසේ නැතිව නිරපේක්ෂ වාස්තවික සදාචාරයක් නැත. අද සදාචාරය තීරණය වන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්ෂව ය. සදාචාරය පමණක් නොව මානව හිමිකම් ද තීරණය කෙරෙන්නේ ඒ සංස්කෘතියෙහි ය. කෙටියෙන් කියන්නේ නම් අද එවැනි දෑ සියල්ල තීරණය කෙරෙන්නේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය.

තවත් එකා කරුණක් පමණක් එකතුකරන්නේ නම් ක්ෂේත්‍ර කිහිපයක දී හැරෙන්නට ඒ තීරණයවන්නේ නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ය. ඒ සුසමාදර්ශයට අමතරව බටහිර ඇති තාපගතික සුසමාදර්ශය හා ක්වොන්ටම් සුසමාදර්ශය පමණක් නොව අයින්ස්ටයිනීය සුසමාදර්ශය ද ඒ රටවල මුල් අල්ලා නැත. අද ක්වොන්ටම් භෞතිකයෙහි සිදුවන ඇතැම් ක්‍රියා ගැන සලකාබැලීමේ දී පෙනෙන්නට ඇති කරුණක් නම් ක්වොන්ටම් භෞතිකයෙහි පර්යේෂණ කරන බටහිර භෞතික විද්‍යාඥයන් වුව ද තවමත් නිව්ටෝනීය සුසමාදර්ශයෙහි හා අයින්ස්ටයිනීය සුසමාදර්ශයෙහි කරවටක් ගිලී ඇති බව ය. බටහිර සාමාන්‍ය ජනයාට නම් තවමත් නිව්ටෝනීය සුසමාදර්ශයෙන් එහාට බැලීමට නො හැකි ය.

බටහිර ඇතැම් කලාකරුවන් මේ සුසමාදර්ශයෙන් ගැලවී යෑමට යත්න දරන බව පෙනෙයි. ඊනියා අධි යථාර්ථවාදය, විකාර රූප කලාව, මැජික් රියැලිසම් හෙවත් ඉන්ද්‍රජාල යථාර්ථවාදය, ආදිය ගැන සිත් යොමුකරන්නේ නිව්ටෝනීය සුසමාදර්ශයෙන් කැඩීමට ය. එහෙත් ඔවුන්ට එතරම් දුරකට ඉන් වෙන්විය නො හැකි ය. එයට හේතුව බටහිර තවමත් රජයන්නේ නිව්ටෝනීය සුසමාදර්ශය වීම ය. එහෙත් අතීතයේ සිංහල බෞද්ධ සංස්කෘතිය ද ඇතුළු විවිධ සංස්කෘතීන්හි  නිව්ටෝනීය සුසමාදර්ශයක් නොතිබු බැවින් එහි ඊනියා යථාර්ථවාදී සාහිත්‍යයක් වෙනුවට ඉන්ද්‍රජාලික යථාර්ථවාදයට හෝ අධියථාර්ථවාදයට හෝ සමීප සාහිත්‍යයක් දැකිය හැකි ය.

ජාතකකතාව ගැන කීමේ දී එහි යථාර්ථවාදයක් නැති බව අපි කීවෙමු. සතුන් කතාකරන, සිහිනවලට තේරුමක් ඇති සාහිත්‍යයක් අද පවත්නා ප්‍රවර්ග (categories) යොදාගනිමින් ඉන්ද්‍රජාලික යථාර්ථවාදයක් හෝ වෙනත් යමක් ලෙස හැඳින්වීම විලාසිතාවක් වුව ද එහි වැදගත්කමක් නැත. අප කළ යුත්තේ එදා තිබු සංස්කෘතියට සාපේක්ෂව ඒ කතා ගොතා ඇත්තේ කෙසේදැයි තේරුම්ගැනීම ය. එහෙත් කිසිවකු ඒ කාර්යය කරන බවක් නො පෙනෙයි. ථෙරගාථා හා ථෙරිගාථා රචනා කෙරී ඇත්තේ මිනිසුන්ට හා ගැහැණුන්ට තම ආශාවන් මැඩපවත්වාගත හැකිය යන තේමාවෙන් හා එසේ මැඩගැනීමෙන් ශාන්ත වු සුවයක් ලබාගත හැකිය යන පරමාදර්ශය පෙරදැරි කරගනිමින් ය.

බොහෝ දෙනාගේ ප්‍රසාදයට හේතු වු සංකාරා චිත්‍රපටිය අප කෙතරම් උගුලක හිර වී ඇත් ද යන්න කාහටත් ඇසෙන පරිදි එහෙත් නෑසෙන්නට කියා දෙයි. එහි ඇත්තේ තරුණ භික්ෂුන්වහන්සේ නමකගේ චරිතය මුහුණ දෙන අත්දැකීමකි. ඒ භික්ෂුවට තමාගේ පෘථග්ජන සිත මෙල්ලකරගැනීමට නො හැකිවෙයි. මේ ථෙරගාථාවෙහි කියැවෙන කතාවක් නො වෙයි. එහෙත් ගිහි බෞද්ධයෝ ද බොහෝ භික්ෂුන්වහන්සේ ද සංකාරා හොඳ චිත්‍රපටියක් යැයි කීහ. සුළඟ එනු පිණිස හා අක්ෂරය චිත්‍රපටිවලට සිංහල බෞද්ධයන්ගෙන් එල්ල වු විරෝධය සංකාරා චිත්‍රපටියට එල්ල නොවුයේ ඇයි? එයට හේතු ගණනාවක් ඇත.

චිත්‍රපටියේ  සිනමාරූපී බව මෙහි දී සාකච්ඡාවට භාජනය නොවන බව පළමුව කිව යුතු ය. අප අවධානය යොමුකරන්නේ අන්තර්ගතයට ය. ඕනෑම අන්තර්ගතයක් විවධාකාරයෙන් ග්‍රහණය කළ හැකි බව පැහැදිලි ය. එහි ඇත්තේ සාපේක්ෂ බවකි. එක් පුද්ගලයකු චිත්‍රපටියක හෝ නවකතාවක හෝ දකින අන්තර්ගතය වෙනත් පුද්ගලයකු නොදකිනු ඇත. අක්ෂරය හා සුළඟ එනු පිණිස චිත්‍රපටි සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධ අන්තර්ගතයක් රැගත් චිත්‍රපටි ලෙස චිත්‍රපටි ගැන උනන්දුවක් දක්වන බොහෝ දෙනා දුටුවෝ ය. එහෙත් ඒ පිරිස් සංකාරා එසේ  නොදුටුවෝ ය. මෙහි දී චිත්‍රපටියට ලැබුණු පුර්ව ප්‍රචාරය ද තීරණාත්මක සාධකයක් විය. චිත්‍රපටිය ඊනියා බෞද්ධ චිත්‍රපටියක්

© Prof. Nalin De Silva

ලෙස ජනතාව අතරට ගෙනයෑමට එහි ප්‍රචාරකයන්ට හැකිවිණි. චිත්‍රපටියකට ලැබෙන පූර්ව ප්‍රචාරය යනු චිත්‍රපටියේ අධ්‍යක්‍ෂක නිෂ්පාදක ආදීන් විසින් ලබාගන්නා ප්‍රචාරයකි. ඒ ලබෙන ප්‍රචාරයකට වඩා ලබාගන්නා ප්‍රචාරයකි. ප්‍රචාරය ද නිර්මාණයක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

අක්‍ෂරය හා සුළඟ එනු පිණිස ප්‍රචාරකයන්ට ඒ බෞද්ධ චිත්‍රපටි ලෙස ප්‍රේක්‍ෂකයන්ට හඳුන්වාදීමේ අවශ්‍යතාවක් නො වී ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ප්‍රසිද්ධියේ ම සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දොස් දැකීමට ය. සිංහල බෞද්ධ බහුතරය විසින් ඒ ප්‍රතික්‍ෂෙප කරනු ලැබීම පුදුමයක් නො වෙයි. එහෙත් සංකාරා එසේ නො වී ය. සමස්තයක් ලෙස ගත්කල ජනතාව එය ග්‍රහණය කරගත්තේ බෞද්ධ චිත්‍රපටියක් ලෙස ය. සංකාරා යනු සංඛාරා නොවුව ද සිංහල බෞද්ධයනට ඒ දැනෙන්නේ සංඛාරා ලෙස වීම ද එයට එක් හේතුවක් විය. එහෙත් මේ චිත්‍රපටියෙන් කියන්නේ, හැඟෙන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය ගතානුගතික මෙවලමක් පමණක් බව ය.

චිත්‍රපටියට, එනම් එයට හවුල්වූවනට, අවශ්‍යවූයේ මිනිසකුගේ චිත්ත අභ්‍යන්තරයෙහි දෙගඩියාව, ඒ පැත්තට මේ පැත්තට ඇදීම, නිරූපණයකිරීම නම් ඒ සඳහා භික්‍ෂුන්වහන්සේ නමකගේ චරිතය යොදාගත්තේ ඇයි? වෙනත් ආගමික පූජකවරයකුගේ හෝ කන්‍යා සොහොයුරියකගේ හෝ පූජකත්වය නොමැති වෙනත් අයකුගේ චරිතය ඒ සඳහා යොදාගත හැකිව තිබුණි. මෙරට බහුතරය සිංහල බෞද්ධයන් නිසා භික්‍ෂු චරිතය එයට සුදුසු යැයි චිත්‍රපටියට හවුල්වූවෝ සිතුවෝ ද? මේ ප්‍රශ්නය සාකච්ඡාකිරීමේ දී අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා නිව්ටෝනීය සුසමාදර්ශය විසින් කලාවට ද ඇතුල්කර ඇති සාධාරණීකරණය (generalization) අපට වැදගත් වෙයි.

බටහිර විද්‍යාව මූලික වශයෙන් කරන්නේ සාධාරණීකරණයකි. එහි දී අප ඉගෙන ගන්නේ වායුවක ගුණ හෝ අම්ලයක ගුණ හෝ මිස අපට දී ඇති වායු නියැදියක ගුණ නො වේ. බොයිල්ගේ නියමය යම් උෂ්ණත්ව පරාසයක දී සියළු වායුවලට අදාළ වෙයි. නිව්ටන් විද්වතා මේ සම්බන්ධයෙන් කෙතරම් දුරට ගොස් තිබුණේ ද කිවහොත් ඔහු තම ගුරුත්වාකර්ෂණ නියමය හැඳින්වූයේ සර්වත්‍ර නියමයක් (universal law) ලෙස ය. ගුරුත්වාකරඃණ නියමය දී ඇති සුවිශේෂ අංශු දෙකක් සඳහා නොව විශ්වයේ ඕනෑම අංශු දෙකක් සඳහා වලංගු වෙයි. එපමණක් නොව එහි කාල භේදයක් හෝ අවකාශ (ප්‍රදේශ) භේදයක් හෝ නැත. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ නියමය  විශ්වයේ ආරම්භයේ සිට අවසානය දක්වා (එසේ ආරම්භයක් හා අවසානයක් ඇත්නම්) වලංගු වෙයි. එමෙන් ම ඒ නියමය විශ්වයේ එක් කොණක සිට අනෙක් කොණ දක්වා වලංගු ය. (විශ්වයට කොණක් ඇත් ද නැත් ද යන්න මෙහි දී සැලකිල්ලට නොගත යුතු ය.)

බටහිර විද්‍යාව අප පුහුණු කරන්නේ එසේ සාධාරණීයව සිතීමට ය. අප යම්කිසි සුවිශේෂයක් ගැන කතාකරන්නේ නම් ඒ පැහැදිලිව දැක්විය යුතු ය. උදාහරණයක් ලෙස කැලණි ගඟේ ජලයෙහි ඇති අපද්‍රව්‍ය ගැන අපි කතාකරමු. එසේත් නැතහොත් අපට කොළඹ නගරයේ වායු දූෂණය ගැන සඳහන් කළ හැකි ය. එවැනි අවස්ථාවක අපි ජලයේ ගුණ හෝ වායුවක ගුණ හෝ සාධාරණ වශයෙන් නො සලකමු. කැලණි ගඟේ නැතහොත් කොළඹ නගරයේ යනුවෙන් අපි එහි දී සුවිශේෂත්වය හඟවන විශේෂණ පද යොදාගනිමු. අපි එපමණකින් හෝ නතර නො වෙමු. අපි අසවල් දවසේ අසවල් වෙලාවේ අසවල් ප්‍රදේශයේ කැලණි ගඟේ ජලයේ තිබූ අපද්‍රව්‍ය ගැන කියමු. කැලණිතිස්ස රජු සමයෙහි කැලණි ගඟේ ජලය අද මෙන් අපවිත්‍ර නොවූ බව අපි දනිමු.

කැලණි ගඟේ ජලයෙහි ගුණ (එයට මිශ්‍ර වී ඇති අපද්‍රව්‍ය කවරේ ද ආදිය) සාධාරණ වශයෙන් ජලයෙහි ගුණ නොවන බව අපි දනිමු. සාධාරණ වශයෙන් ජලය යනුවෙන් ගැනීමේ දී අපද්‍රව්‍ය මිශ්‍ර නොවූ ජලය අපට විෂය වෙයි. අද දහවල් කැලණි ගඟේ ජලයේ ඇති අප ද්‍රව්‍ය ප්‍රමාණයෙන් තව අවුරුදු පණහකින් එහි අපද්‍රව්‍ය කොපමණ තිබේ ද යන්න දැනගැනීමට අපි නො වෙහෙසෙමු. එමෙන් ම මහවැලි ගඟේ යම් තැනක යම් වෙලාවක ඇති අපද්‍රව්‍ය ගැන නිගමනයකිරීමට කැලණි ගඟෙන් ලබාගත් දත්ත යොදාගැනීමක් නො කෙරෙයි.

බටහිර විද්‍යාවෙහි නියම ප්‍රවාද ආදිය සාධාරණ වන අතර සුවිශේෂ නියැදි සාධාරණීකරණයෙන් වෙන්කරගැනීමට ද අපි දනිමු. එහෙත් කලාවේ දී එවැන්නක් සිදුවේ ද? ජාතකකතාවකින් නිරූපණය වන්නේ මුළු මහත් මනුෂ්‍යත්වය ද? එසේත් නැත්නම් සුවිශේෂ පුද්ගලයකු පමණක් ද?  පුද්ගලයා තුළ මනුෂ්‍යත්වය ඇතැයි යන බොරු පණ්ඩිත කතා

© Prof. Nalin De Silva

ගෙතී ඇත්තේ මේ ප්‍රශ්නයට නිසි පිළිතුරක් ලබාදීමට අප අපොහොසත් වී ඇති බැවිනි. ඕනෑම පුද්ගලයකු මනුෂ්‍යයකු බව සැබෑ ය. එහෙත් පුද්ගලයන් දෙදෙනකු එක ම ආකාරයෙන් ක්‍රියා නොකරන බව ද අපි දනිමු.

පුද්ගලයන් දෙදෙනකු ගැන අපට කතාකිරීමට සිදුවන්නේ හයිඩ්‍රජන් වායු නියැදි දෙකක් ගැන කතාකරන ආකාරයෙන් නො වෙයි. මෙහි දී හයිඩ්‍රජන් වායු නියැදියක් යන්නෙන් සැලකෙන්නේ වෙනත් වායු සමග මිශ්‍ර නොවූ හයිඩ්‍රජන් වායුව පමණක් අඩංගු නියැදියකි. එවැනි වූ හයිඩ්‍රජන් වායු නියැදි දෙකක් කවදා කොතැනක දී ලබාගත්තත් එකම ආකාරයෙන් හැසිරෙන බව බටහිර විද්‍යාව අපට කියයි. අපද්‍රව්‍ය මිශ්‍ර වූ හයිඩ්‍රජන් වායු දෙකක් ඒ අපද්‍රව්‍ය ප්‍රමාණය අනුව වෙනස් ගුණ ගන්නා බව ද අපි දනිමු.

අපට අමිශ්‍ර හයිඩ්‍රජන් වායු නියැදි ලබාගත හැකි වුව ද (අඩුම තරමින් සෛද්ධාන්තිකව (theoretically) ලබාගත හැකි ය. ප්‍රායෝගිකව ගත්කල ඕනෑම හයිඩ්‍රජන් වායු නියැදියක ඉතා සුළුවෙන් හෝ අපද්‍රව්‍ය ඇතැයි යමකුට කිව හැකි ය.) අමිශ්‍ර මිනිසකු ලබාගත හැකි ද? අමිශ්‍ර මිනිසා යනු කවු ද? සාධාරණ මිනිස් ගුණ ඇත්තා අමිශ්‍ර මිනිසකු යැයි අපට කිවහැකි ය. එහෙත් සාධාරණ මිනිස් ගුණ යනු කවරේ ද? වෙනත් වචනවලින් කියන්නේ නම් වියුක්ත මිනිසා කවු ද? එවැනි සාධාරණ වියුක්ත මිනිසකු වේ නම් අසවලා යනු මේ මේ අපද්‍රව්‍ය මිශ්‍ර වී ඇති මිනිසා යැයි අපට කිවහැකි ය. එහෙත් එවැනි වියුක්ත මිනිසකු සෛද්ධාන්තිකව හෝ ලබාගත නො හැකි ය. විශ්වයේ පවතින ඕනෑම අංශුවක් ගුරුත්වාකර්ෂණ නියමය සම්බන්ධයෙන් ගත්කල සාධාරණ අංශුවකි. එහෙත් සංඛාරා චිත්‍රපටියෙහි භික්ෂූන් වහන්සේ සාධාරණ මිනිසෙක් නො වෙයි. ඒ භික්ෂූන්වහන්සේ චිත්‍රපටියෙහි පෙනෙන විට අපට සාධාරණ මිනිසකු තබා සාධාරණ භික්ෂූන්වහන්සේ නමක හෝ දැකගත නො හැකි ය. වැඩිම වුවහොත් අපට සාධාරණ ව දැකගත හැකිවන්නේ සිංහල භික්ෂූන්වහන්සේ නමකි. කලාවේ විශ්ව සාධාරණීකරණයක් නැත. එහි ඇත්තේ සීමිත සාධාරණීකරණයකි. එහෙත් ඒ පවා එලෙස අප දකින්නේ නිර්විරෝධී සුසමාදර්ශයෙහි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva